උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!
සාතන-දිවි තොර කරගැනීම් සඳහා සාපේක්ෂව ඉහළ මාධ්‍ය අවධානයක් ලැබේ. එනිසාම, එවැනි සිදුවීම් ඉදිරිපත් කිරීමේදී ද, සාතන-දිවි තොර කරගැනීම සිදුවූ ආකාරය සඳහන් නොකිරීම ඇතුළු, ඒ සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශන අනුගමනය කිරීමත්, හැකි උපරිම අයුරින් ප්‍රවේසම් සහගත වීමත් අත්‍යවශ්‍ය වේ.
වවුනියාවේ පුද්ගලයෙකු සහ ඔහුගේ බිරිඳ සහ දරු දෙදෙනා මිය ගිය සාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමක්, අද පුවත්පත (මාර්තු 08, 2023) තුළ පළ වී තිබිණි.
"වවුනියාව නිවසකින් එකම පවුලේ සිවුදෙනෙකුගේ මළ සිරුරු හමුවෙයි" යන සිරස්තලය යටතේ එය පළ වී තිබිණි.
මෙම පුවත් වාර්තාව අවසානයේදී, හදිසි උපකාරක අංක ද පළ කෙරී තිබිණි.
දිවි තොර කරගැනීම්, ඊට තැත් දැරීම් හෝ, සාතන-දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී හදිසි උපකාරක අංක පළ කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ ඔස්සේ, එවැනි හැසිරීමකට නැඹුරුතාවය ඇති අයෙකු උපදේශනය වෙත යොමු වීමට වැඩි අවකාශයක් නිර්මාණය වනු ඇත.
අද පුවත්පත මෙම සාතන-දිවි තොර කරගැනීමේ පුවත සමඟ හදිසි උපකාරක අංක සඳහන් කිරීම ප්‍රශංසනීය බව මෙසේම සඳහන් කරමු.
හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
(මෙදින DailyMirror පුවත්පත තුළ ද මෙම පුවත පළ වී තිබූ නමුත්, එහි හදිසි උපකාරක අංක ඇතුළත්ව නොතිබුණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# උපකාරක අංක සඳහන් කිරීම ප්‍රසංශනීයයි!


2023-03-08

අද

වවුනියාව නිවසකින් එකම පවුලේ සිවුදෙනෙකුගේ මළ සිරුරු හමුවෙයි

වවුනියාව - මධුෂංඛ අමරසිංහ